**27-08-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබේ වාසනාව සතෝප්‍රධාන් කර ගැනීමට නම්, ස්මෘතියෙන් සිටීමට මහා උත්සාහය ගන්න. සෑම විට මෙසේ සිහි කරන්න: මා අශරීරික ජීවාත්මයක් වන අතර පියාගෙන් සම්පූර්ණ උරුමය ලබා ගත යුතුව ඇත.

**ප්‍රශ්නය:** ඇතැම් දරුවන්ට ස්මෘති සටහන තබා ගැනීමට අසීරු වන්නේ මක් නිසා ද?

**පිළිතුර:** ඔවුන් ස්මෘතිය යනු කුමක් දැයි නිවැරදිවම නොදන්නා නිසයි. ඔවුන් ස්මෘතියෙන් සිටින විට බුද්ධිය පිටතට යයි; ඔවුන් සාමයට එන්නේ නැත. ඔවුන් වටපිටාව ද දූෂිත කරයි. ඔවුන්ට ස්මෘතියක් නැති කළ සටහනක් කෙසේ තබන්න ද? කවුරු හෝ බොරු ලියූ විට බොහෝ දඬුවම් ලැබෙනු ඇත. ඔබ සත්‍ය පියාට සත්‍යය පැවසිය යුතුයි.

**ගීතය:** මගේ වාසනාව අවදිකරගෙන පැමිණියෙමි...

ඕම් ශාන්ති. සෑම දිනයකම අධ්‍යාත්මික පියා දරුවන්ට තෝරා දෙන්නේ හැකි තාක් අශරීරික ජීවාත්ම අවධානයෙන් සිටිය යුතු කියාය. ඔබ අශරීරික ජීවාත්මයක් වන අතර පියා සිහිකරමින් ඔබේ වාසනාව අසීමිත සතුටක් ලෙස ලබා ගැනීමට අසීමිත පියා වෙත යා යුතු බව පිළිබඳව ශ්‍රද්ධාවත් වන්න. ඒ නිසා ඔබ නියත ලෙසම පියා සිහිකළ යුතුයි. පාරිශුද්ධියට පත් සතෝප්‍රධාන් නොවී ඔබේ වාසනාව සතෝප්‍රධාන් කර ගත නොහැක. මෙය හොඳින්ම සිහි තබා ගන්න. ප්‍රධාන එකම දෙයක් ඇත. මෙය ලියා තබා ගන්න. සමහරු මේවා බාහුවේ ලියා ගනී. ඔබ ද ලියා තබා ගන්න මා වූ කලී අශරීරික ජීවාත්මයක් වූ අතර අසීමිත පියාගෙන් මුළු උරුමය ලබා ගනිමින් සිටිමි. මායා මෙය අමතක කරවයි. ඔබ කොහේ හෝ ලියා තබා ගත්තොත් නැවත නැවත සිහිපත් කළ හැකිය. සමහරු මෙය මතක් කර ගැනීම සඳහා ක්‍රිෂ්ණාගේ පිංතූරය හෝ ඕම් ඇඳ තබා ගනී. මෙය සියල්ලටම වඩා අළුත් සිහිපත් කර ගැනීමයි. අසීමිත පියා පමණි මෙය තෝරා දෙන්නේ. මෙය තේරුම් ගැනීමෙන් ඔබ සිය වාරයක් නොව මිලියන වාරයක් වාසනාවන්ත වේ. පියා සිහි නොකිරීමෙන් හා ඔහු නොදැනීමෙන් ඔබ දිළිඳු වී ඇත. මෙම එකම පියා පමණි ඔබේ ජීවිතයට සදා සතුට ලබා දෙන්නේ. සමහරු ඔහු සිහිකළත් ඔහු ගැන හරියටම දන්නේ නැත. දෙවියන් හැම තැනම අතයි ලෝකයේ මිනිසුන් උගත්තේ ද භාරතයෙනි. භාරතය කඩා වැටුණු විට සියල්ල කඩා වැටේ. සත්‍යයේ දේශය හෙවත් ලෝකය සෑදීමට වග කියන්නේ භාරතයයි. එසේ දෙව්ලොවක් ලබා දෙන කෙනා අපහාසයට ලක් කර ඔහු අමතක කර ඇත. ඒ නිසා මෙසේ ලියැවී ඇත අන්ත ලෙස අනාගමික වූ විට මම එමි. පියාම පැමිණ මෙහි තේරුම කියා දෙයි. ඒ එකම පියාගේ මහත්වය එයයි. ඔබ දැන් පියා එන බව හරියටම දන්නා අතර ශිවාගේ උපන් දිනය ද සමරයි. කෙසේ නමුත්, ඔවුන් ශිවාගේ උපන් දිනය නොසලකා හරියි. එය එසේ විය යුතුයි මක් නිසා ද ඔහු මෙහි පැමිණ ආපසු ගිය නිසා. සත් යුග ආදී සනාතන දෙව් දේවතා ධර්මය ස්ථාපනය කරන්නේ ඔහුයි. අන් ආගම්වල මේ මේ අය මෙසේ ස්ථාපනය කළා යැයි සියල්ලෝ දනිති. ඒ සියල්ලටම පෙර වූයේ දෙව් දේවතා ආගම පමණි. එය කෙසේ අතුරුදහන් වූවා දැයි ඔවුන් නොදනී. පියා පැමිණ ඔබට විස්තර කර දෙයි. පියා ඉහළම ඉහළ කෙනාය. වෙන කෙනෙකුට ඒ ප්‍රසාදය නොලැබේ. ආගම් කර්තෘවරුන්ගේ වර්ණනාව කුමක් ද? පියා පිරිසිදු ලෝකය ස්ථාපනය කරන අතර අපිරිසිදු ලෝකය වෙනස් කරයි. මායාවෙන් ජය ගැනීමට ඔහු ඔබට මඟ සළසයි. මෙය අසීමිත කරුණකි. මුළු අසීමිත ලෝකය පුරා රාවණ් රජ දහන ඇත. එය සීමිත ලංකාවේ ප්‍රශ්නයක් නොවේ. මේ ජය පැරදුම පිළිබඳ කතාව භාරතය ගැනයි. අන් සියල්ල අතුරු කතා වේ. භාරතයේ පමණි තනි ඔටුන්න සහ ද්විත්ව ඔටුනු සහිත රජවරු ඉන්නේ. මහා අධිරාජයන් සිට නැති වී ගියත් ඒ එක්කෙනෙකුට වත් ආලෝක ඔටුන්නක් තිබුණේ නැත. තිබුණේ දෙව් දේවතාවන්ට පමණි. දෙව් දේවතාවුන් දෙව්ලොව හිමිකරුවන් නොවේ ද? ශිව බාබා වූ කලී පාරිශුද්ධකරුවාණන් වන උත්තරීතර පියා ය. ඔහු කොහොම ද ආලෝකය දෙන්නේ. ආලෝකය දිය යුත්තේ ආලෝකය නැති කෙනෙකුටයි. ශිව බාබාගේ ආලෝකය කෙදිනක හෝ නැති නොවේ. තිතක ආලෝකය පෙන්වන්නේ කෙසේ ද? දිනෙන් දින බාබා ඔබේ බුද්ධිය තුළ රඳවා ගත යුතු ගැඹුරු කරුණු විස්තර කරයි. ප්‍රධාන වන්නේ ස්මෘති වන්දනාවයි. මායාගේ බාධාවන් ඇත්තේ මෙයටය. සමහරු සටහන තබන විට 50% - 60% ක් යැයි සටහන් කළ ද ස්මෘති වන්දනාව ගැන තේරුම් ගෙන නැත. මෙය ස්මෘතියද? ඔවුන් දිගටම අසයි. එය ඉතා අපහසුයි. ඔබ මෙහි විනාඩි 10 - 15 සිටියත් ස්මෘතිය නිවැරදිවම ඇත්දැයි ඔබ පරීක්ෂා කරයි. ස්මෘතිය නොමැති බොහෝ දෙනා ඇත. ඔවුන්ගේ

බුද්ධිය දවස පුරාම පිටතට යයි. ඒ නිසයි ඔවුන් මෙහි ආ විට සාමයක් නැත්තේ. සටහන් නොතබන්නේද ඒ නිසයි. බොරු ලිවූ විට දඬුවම විශාලය. බොහෝ දරුවන් වැරදි කර පියාගෙන් වසන් කරයි. ඇත්ත කතා කරන්නේ නැත. ඔහුට පියා යැයි අමතනවා නම් ඇත්ත නොකිවූ විට බොහෝ පව් රැස් වෙයි. කෙනෙක් නරකම දෙයක් කළොත් ඒ ගැන බොහෝ ලැජ්ජා වී ඇත්ත නොකියයි. එවිට ඔහු කරන්නේ බොරු කීමයි. මෙසේ සඳහන්ව ඇත. මායා මිත්‍යාවකි, ශරීරය මිත්‍යාවක් වන අතර මුළු ලෝකයම මිත්‍යාවකි. මිනිසුන් සම්පූර්ණයෙන් ශරීර අවධානයට පැමිණ ඇත. ඇත්ත කීම හොඳ දේකි. එවිට අන් අයද ඔබෙන් ඉගෙන ගනී. මෙහිදී ඔබ ඇත්තට ගරුකළ යුතුයි. ඥානයත් සමඟ ස්මෘති වන්දනාවද අතිශයින් අවශ්‍යය, මක් නිසාද ඔබටත් ලෝකයටත් යහපතක් වන්නේ ස්මෘති වන්දනාවෙන් පමණි. මේ ඥානය තේරුම් කිරීම පහසුවෙන් කළ හැකිය. උත්සාහය අවශ්‍ය වන්නේ ස්මෘතිය සඳහාය. බීජයකින් ගසක් මතු වන බව කවුරුත් දනී. ඔබේ බුද්ධිය තුළ උපත් 84 චක්‍රය ගැනත් බීජය හා වෘක්ෂය ගැනත් ඥානය ඇත. පියා වූ කලී පරම සත්‍යයයි, සජීවී පැවැත්මයි හා ඥාන සාගරයයි. ඔබට විස්තර කළ ඥානය ඔබ තුළ ඇත. මෙය සම්පූර්ණයෙන්ම අසාමාන්‍ය දෙයකි. මෙය මිනිස් වෘක්ෂයයි. මෙය ද කිසිවෙක් නොදනී. කවුරුත් කියන්නේ එයද නොවේ මෙයද නොවේ කියාය. කාල සීමා වලින් නම් ඔවුන් දන්නේ මොනවාද? ඔබ අතරින් ද මෙය හරි හැටි දන්නේ ඉතා සුළු දෙනෙකි. අධ්‍යාපන සැසි සූදානම් කරන්නේ හැම කෙනාගේම අදහස් ලබා ගැනීමටය. ඕනෑම කෙනෙකුට ඔවදන් දිය හැක. අවවාද දිය හැක්කේ නම් සඳහන් අයට පමණක් නොවේ. ඔබේ නම සඳහන් නොමැති විට ඔබට අවවාද දිය හැකි යැයි කිව නොහැක. කාට හෝ සේවය සඳහා උපදෙස් ඇත්නම් එය ලියා දැන්විය හැකියි. ඔබට කීමට උපදෙස් ඇත්නම් බාබාට ලියන්න. ''බාබා, මේ ක්‍රමයෙන් ඉතා විශාල ලෙස සේවය දියුණු වනු ඇත.'' ඕනෑම කෙනෙකුට උපදෙස් දිය හැක. එවිට බාබා ලැබී ඇති විවිධ උපදෙස් දෙස බලයි. බාබා දිගින් දිගට කියන්නේ ඔබ එකට රැස් වී සෑම දෙනාටම මෙම පණිවුඩය ලබා දී භාරතයට යහපතක් කිරීමට සිටීමටයි. මේවා බාබාට ලියා දන්වන්න. මායා සියලු දෙනා නිද්‍රාගත කර ඇත. මරණය අභියස ඇති විට පියා පැමිණෙයි. පියා මෙසේ කියයි දැන් සියලු දෙනාගේ ආපසු යන කාලයයි. ඔබ ඉගෙනගත්තත් නැතත් සියලු දෙනාට මරණය නියතයි. ඔබ සූදානම් වුවත් නැතත් නව ලෝකය නියතයෙන්ම සැදෙමින් ඇත. හොඳ දරුවන් ඔවුන්ගේ සූදානම් සිදුකර ගනිමින් සිටී. සුදාමාගේ ආදර්ශය සිහි කර දෙන්නේ ඔහු හාල් මිටක් දුන් නිසයි. ''බාබා, මට මාලිගාවක් ලැබිය යුතුයි'' ඔහුට හාල් මිටක් පමණක් නම් තිබුණේ වෙන කුමක් කරන්නද? බාබා මමා ආදර්ශයක් ලෙස පෙන්වයි. ඈ කිසිවක් නොගෙන විත් ඒ තරම් ඉහළ තත්ත්වයක් ලැබුවාය. මෙහි මුදල් ප්‍රශ්නයක් නොමැත. ඔබ ස්මෘතියෙහි පිහිටා අන් අය ද ඔබ හා සමාන ලෙස සකස් කළ යුතුය. බාබා කිසිම ගෙවීමක් අය නොකරයි. සමහරුන්ට මුදල් තිබෙන නිසා එය මෙම යශ්‍යා ආයතනයට දී වටිනා ලෙස යොදා ගැනීමට අවශ්‍යය. ''වෙනස්වීම කොහොමත් සිදුවන අතර සියල්ල අපතේ යයි.'' මම මෙසේ කිරීම මඟින් යමක් වටිනා ලෙස යොදා ගත හැකිය. හැම මනුෂ්‍යයෙක්ම අඩු ගණනේ යම් දානයක් හෝ පිනක් කරයි. ඒ දාන මාන විකර්ම කරන අයගෙන් විකර්ම කරන අයටමය. එසේ වුවද ඔවුන්ද යම් තාවකාලික ඵලයක් ලබයි. කෙනෙක් විශ්ව විද්‍යාලයක් හැදුවොත් හොඳ ඉගෙනීමක් ලැබුවත් අසනීප ආදිය තිබේ. රෝහලක් හැදුවොත් හොඳ නිරෝගී බව ලැබුණත් සියලූ අපේක්ෂාවන් ඉටු නොවේ. මෙහිදී අසීමිත පියා ඔබේ සියලු අවශ්‍යතා ඉටු කරයි. ඔබ පාරිශුද්ධත්වයට පත් වේ. ඒ නිසා ඔබේ සියලු ධනය ලෝකය පිරිසිඳු කිරීමට යොදන එක නේද හොඳ? ඔබ මුක්තිය හා ජීවන මුක්තිය ලබන අතර එයද චක්‍ර භාගයකටය. හැමෝම අහන්නේ සාමය ලබන්නේ කෙසේ ද කියාය. එය ලැබිය හැක්කේ සාම දේශයේ දී පමණි. සත් යුගයේ දී එකම ආගමක් පමණක් ඇති නිසා සාමයෙන් තොර වීමක් නැත. රාවණ් රාජ්‍යයේ ඇත්තේ සාමයෙන් තොර බවයි. රාම රජුගේ මෙන්ම රාමාගේ වැසියන් ද ඇතැයි කියැවේ. එය අමරණීය දේශයයි. අමරණීය දේශයේ මරණය යන වචනය නැත. මෙකල මිනිසුන් හිටිගමන් මරණයට පත් වේ. මෙය මරණයේ දේශය වන අතර එය අමරණීය දේශයයි. ඔවුන් ශරීර අත් හරිනවා පමණක් වන අතර නැවත පොඩි දරුවන් බවට පත් වේ. එහි අසනීප අදිය නැත. එය එතරම්ම යහපත්ය. ඔබ ශ්‍රී ශ්‍රී කෙනාගේ උපදෙස් පිළිපැදීම මඟින් සදා සුවය ලබමින් සිටී. ඒ නිසා මෙවැනි අධ්‍යාත්මික මධ්‍යස්ථානයක් විවෘත කළ යුතුයි. එන්නේ ටිකක් වුණත් එය සුළු නැත. මෙකල කිසි මනුෂ්‍යයෙක් නාටකයේ මේ කාල සීමාව නොදනී. මෙය උගන්වන්නේ කවුදැයි ඔවුන් අසයි. ඔවුන්ට මෙසේ කියන්න මේවා කියන්නේ පියාය. එසේ කියන බ්‍රහ්ම කුමාරයන් හා කුමාරියන් බොහෝ ඇත. ඔබද ශිව බාබාගේ දරුවෙක් වන බ්‍රහ්ම කුමාරයෙක්ය. ඔබ ප්‍රජාපිතා බ්‍රහ්මාගේ දරුවෙක් ද වෙයි. මොහු මනුෂ්‍ය සංහතියේ ආදීම මුතුන් මිත්තාය. බ්‍රහ්ම කුමර කුමරියන් වන අප මතුවන්නේ ඔහුගෙනි. පරම්පරා ගස් ඇත. ඔබේ දෙවි දේවතා කොට්ඨාශය විශාල සතුටක් ගෙන දෙන්නකි. ඔබ මෙහිදී උසස් වී එහි ගොස් රජදහන කරවයි. මෙය කාගේවත් බුද්ධිය තුළ නොරඳයි. ඔබ දරුවන්ට විස්තර කර දී ඇති ලෙස දෙවි දේවතාවුන්ට

මෙම තමෝප්‍රධාන් ලෝකයේ පය ගැසිය නොහැකිය. ඔවුන්ගේ අජීවී ප්‍රතිමා සේයාවල් තිබිය හැකිය. නමුත් ඔවුන්ගේ සජීවී ස්වරූප නොවේ. ඒ නිසා පියා මෙසේ විස්තර කරයි දරුවනි, ස්මෘති වන්දනාවේ පිහිටා සිටින්න. කිසිඳු විකර්මයක් නොකර සේවා කිරීමට ක්‍රම නිර්මාණය කරන්න. දරුවන් මෙසේ කියයි බාබා, මම ලක්ෂ්මී නාරායන් වගේ වන්නෙමි. පියා මෙසේ කියයි ඔබේ මුව රෝස මලක් වේවා (ඇත්තෙන්ම ඔබ එසේම වන්න)! කොහොමනමුත්, ඔබ මේ සඳහා උත්සාහ කිරීම අවශ්‍යයි. උසස් තත්ත්වයක් ලබා ගැනීමට නම් අන් අය ඔබට සමාන ලෙස සකස් කිරීමට සේවය කළ යුතුයි. දිනෙක හැම මහ පෙන්වන්නෙක්ම 100 ක් 200 ක් පමණ වන්දනාකරුවන් පිරිසක් ඔහු සමඟ ගෙන එනු ඇත. මේ සියල්ල ඔබ ඉදිරියට යන විට පෙනේවි. සියල්ල කල්තියා කිව නොහැකියි. සිදුවන දෙයක් ඔබට දිගින් දිගට දැකිය හැකයි. මෙය අසීමිත නාටකයයි. ඔබ පියා සමඟම ප්‍රධාන කොටස් රඟපායි, ඔබ මේ වියපත් ලෝකය අළුත් කරයි. මේ වූ කලී ඉතා උසස් සංගම යුගයයි. ඔබ දැන් සතුටු දේශයේ හිමිකරුවන් වෙමින් සිටී. එහි කණගාටුවක නමක් හෝ සේයාවක් නොමැත. පියා වූ කලී දුක නිවන්නා සේම සතුට ලබා දෙන්නාය. ඔහු පැමිණ ඔබ දුකෙන් නිදහස් කරයි. භාරතයේ සමහරු සිතන්නේ ඔවුන්ට ලොකු මාලිගා හා විදුලියත් ධනයත් ඇති නිසා මෙය ඔවුන්ට දෙව්ලොව කියාය. ඒ සියල්ල මායාවේ පම්පෝරිය වේ. සතුට සඳහා ඔවුන් විවිධ පහසුකම් නිපයයි. ඔවුන් විශාල මාළිගා වැනි ගොඩනැගිලි ආදිය සාදයි, නමුත් හිටි ගමන් මරණය ද පැමිණෙයි. එහි මරණයේ බියක් නොමැත. මෙහි කෙනෙක් හිටිහැටියේ මළ විට ඒ වෙනුවෙන් බොහෝ වික්ෂෝප වේ නොහොත් වැලපේ. ඔවුන් සොහොනට ගොස් ඒ වෙනුවෙන් කඳුළු සලයි. ඔවුන්ට විවිධ සිරිත් විරිත් ඇත. විවිධ මත ඇත. සත් යුගයේ එවැනි දෑ නැත. එහි එක ශරීරයක් අතහැර තව ශරීරයක් ගැනීම සිදු වේ. ඔබ යන්නේ සතුටෙන් පිරි තැනකටය. මේ සඳහා ඔබ බොහෝ උත්සාහ කළ යුතුය. හැම පියවරකදීම ඔබ උපදෙස් ගත යුතුයි. අන් අය උපදෙස් ගන්නේ ඔවුන්ගේ ගුරු හෝ ස්වාමිපුරුෂයා හෝ තමාගේ මන් මත් මගින්ය. යක්ෂ උපදෙස් කෙසේ උපකාරී වේ ද? ඒවා ඔබව තවත් යක්ෂ තත්ත්වයට තල්ලු කරයි. ඔබ දැන් දෙව් පියාගේ උපදෙස් ඉහළින්ම ලබයි. ඒ නිසයි මෙසේ කියමනක් ඇත්තේ දෙවියන්ගේ උසස් කියුම්. ඔබ ශ්‍රීමත් අනුගමනය කිරීම මඟින් මුළු ලොවම දෙව්ලොවක් බවට පත් කරවයි. කොහොමනමුත්, කෙනෙක්ගේ වාසනාව තුළ එය නැත්නම් ඔහු එම උපදෙස් අනුගමනය නොකරයි. බාබා කියා ඇත්තේ ඔබ විසින් යම් උපදෙසක් දීමට ඇත්නම් එය බාබාට එවන ලෙසයි. උපදෙස් දීමට තරම් සුදුසු අය බාබා දනී. බොහෝ අළුත් දරුවන් මතු වී එයි. බාබා හොඳ දරුවන් දනී. කඩ පවත්වාගෙන යන අය දත යුතුයි බාබා හඳුන්වා දෙන ක්‍රම පිළිබඳව උපදෙස් දෙන්නේ කෙසේ ද කියා. කඩයේ සෑම කෙනෙකුටම දිගින් දිගටම සිහිගන්වන්න. භාරතයේ සත් යුග කල තිබුණේ එකම ආගමකි. මේ ගැන කලබල වීමට හේතුවක් නැත. සියලු දෙනාගේ පියා ඒකායන කෙනාය. පියා මෙසේ කියයි : මා පමණක්ම නිරතුරුව සිහි කළ විට ඔබේ පව් දුරු වී ඔබ දෙව්ලොව හිමිකරුවන් බවට පත්වේ. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ශ්‍රීමත් අනුගමනය කරන අතර මුළු ලොවම දෙව්ලොව බවට පත් කිරීමට සේවය කරන්න. අනෙක් බොහෝ අය ඔබ හා සමාන ලෙස සකස් කරන්න. යක්ෂ උපදෙස් වලින් ඔබ ආරක්ෂා වන්න.
2. ස්මෘතිය සඳහා උත්සාහ කිරීම මඟින් අශරීරික ජීවාත්මය සතෝප්‍රධාන් බවට පත් කරන්න. සුදාමා කළ සේ ඔබ අත ඇති හාල් අහුර වටිනා ලෙස යොදාගෙන ඔබේ සියලු අභිලාෂයන් සම්පූර්ණ කර ගන්න.

**වරදානය:** එකම එක පියාට මිස වෙන කිසිවෙකුට අයත් නොවීමට අධිෂ්ඨානය තිබීමෙන් ඔබ අමරණීය හා අවිනාශී බවට පත් වේවා.

එකම එක පියාට මිස වෙන කිසිවෙකුට අයත් නොවීමට අධිෂ්ඨානය ඇති සෑම දරුවෙකුගේම මනෝ ස්ථිතිය නිරායාසයෙන්ම සහ පහසුවෙන්ම නිරන්තර හා නොසැලෙන බවට පත්වෙයි. ඔවුන්ට මෙම අධිෂ්ඨානය ඇති විට, සියලු සබඳතා වල අවිනාශී නූල සකස් වන අතර ඔවුන්ට නිරන්තරයෙන් අමරණීය හා අවිනාශී බවට පත්වීමේ ආශිර්වාදය හිමි වෙයි. මෙම අධිෂ්ඨානය තිබීමෙන්, ඔවුන්ගේ උත්සාහයන් සඳහා විශේෂ එසවුමක් ලැබේ. එකම එක පියා සමඟ සියලු සබඳතා ඇති අයට සියලු ලැබීම් ඉබේටම හිමි වෙයි.

**පාඨය:** ඔබගේ සිතීම, කතාව සහ කිරීම යන සියල්ල එකිනෙකට සම වේවා, එවිට ඔබ ඉතාමත් උසස් උත්සාහවන්තයෙකු ලෙස හඳුන්වනවා ඇත.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: සහජ යෝගීවරයෙක් වීම සඳහා, පරමාත්ම දෙවියන්ගේ සෙනෙහසේ අත්දැකීම් ලබන්න.**

ඕනෑම අවස්ථාවක, ඔබට විශේෂිත නෑ සබැඳියාවක අවශ්‍යතාවයක් ඇති වූ විට, එම නෑ සබැඳියාව තුළින් පරමාත්ම දෙවියන්ව ඔබට අයත් කරගන්න. ඔබේ හදවතින්ම "මගේ බාබා" යැයි පවසන්න, එවිට බාබා "මගේ දරුවා" යැයි කියනු ඇත. මෙම සෙනෙහස් සයුරෙහි ඔබව මුසු කරන්න. මෙම සෙනෙහස කෙතරම් ආරක්ෂිත වියනක් ද යත්, මායාට පවා මෙම වියන යටට පැමිණිය නොහැක. පහසු යෝගීවරයෙකු වීමේ මාර්ගය මෙයයි.